**බලශක්ති අමාත්‍යාංශය**

## ලංසු ආරාධනයයි (IFB)

බලශක්ති අමාත්‍යාංශය සඳහා වාහන නැවැත්වීමේ පහසුකම් සහිත කාර්යාල පරිශ්‍රයක් බදු කුලී පදනම මත ලබා ගැනීම - 2026/2027

**ප්‍රසම්පාදන අංකය MOE/ADM/LOG/MIN-PROC./2026/01**

බලශක්ති අමාත්‍යාංශය විසින් වාහන නැවැත්වීමේ පහසුකම් සහිත කාර්යාල පරිශ්‍රයක් බදු කුලී පදනම මත ලබා ගැනීමට අදහස් කරයි. ඒ අනුව, **ශ්‍රී ලංකාවේ බලශක්ති අමාත්‍යාංශය** වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපතිවරයා විසින් පහත සඳහන් අවම අවශ්‍යතා සහිත **කාර්යාල ගොඩනැගිල්ලක් බද්දට ගැනීම** සඳහා යෝග්‍ය සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ:

- **පිහිටීම: කොළඹ 01 -14 දක්වා, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා රාජගිරිය යන ප්‍රදේශයන්** තුළ පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිශ්‍රයක් වීම.
- **අවම වර්ග ප්‍රමාණය**: වර්ග අඩි 40,000
- **පහසුකම්:** විදුලි හා නළ ජල සැපයුම් පහසුකම් (NWS&DB), සනීපාරක්ෂක පහසුකම්. අවශ්‍ය විදුලි සෝපාන ගණන, ගිනි ආරක්ෂණ පද්ධතිය සහිත වීම.
- **වාහන නැවැත්වීමේ පහසුකම:** අවම වාහන **60ක් (රෝද 4ක් සහිත)** සඳහා ඉඩපහසුකම් සහිත වීම( සියලු වාහන පරිශ්‍රය තුළ හෝ වාහන 30ක් පරිශ්‍රය තුළ සහ ඉතිරි වාහන කිලෝමීටර් 1KMක වට ප්‍රමාණය තුළ වර්ග අඩි 500ක ගොඩනැගිල්ලක් සහිතව)
- **බදු කාල සීමාව:** දීර්ඝ කරගැනීමේ පදනම මත වසර දෙකක් (2) සඳහා

**ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB)** පටිපාටිය හරහා ලංසු කැඳවීම සිදු කෙරේ.

### ලංසු ලේඛන ලබා ගැනීම:

උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ට **2026 පෙබරවාරි 23** වන දින සිට **2026 මාර්තු 17** වන දින දක්වා ඕනෑම වැඩ කරන දිනයක **පෙ.ව. 9:00 සිට ප.ව. 3:00** දක්වා **බලශක්ති අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (කාර්ය සම්පාදන)** වෙතින් ලංසු ලේඛන සහ වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

ලංසු ලේඛන ලබා ගැනීමේදී **ආපසු නොගෙවනු ලබන ශ්‍රී ලංකා රුපියල් තුන්දහස් පන්සියයක (ශ්‍රී.ලං.රු. 3,500.00)** ගාස්තුවක් සහ **ආපසු ගෙවනු ලබන රුපියල් දහසය දහස් පන්සියයක් (16,500.00) බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්** නමින් ගෙවිය යුතුය.

ලංසු ලේඛනයට අමුණා ඇති පෝරමයට අනුව සියලුම ලංසු සමඟ 2026 ජූලි 24 වන දින දක්වා [ලංසු වලංගු දිනය + දින 28] වලංගු රුපියල් 1,650,067.00 (මිලියන 1.6) ක වටිනාකමකින් යුතු ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ කර නොමැති, නීති විරෝධී ආකාරයෙන් ඉදිරිපත් කරන ලද ලංසු සහ ලංසු ඇපකරය නොමැතිව ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2026 ජුනි 25 වන දින දක්වා [දින 91] ලංසු වලංගු විය යුතුය.

**පූර්ව ලංසු රැස්වීම් 2026.03.05 දින පෙ.ව.10.00**ට අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේ දී පැවැත්වේ.

වැඩිදුර විස්තර සඳහා: https://energymin.gov.lk

### ලංසු ඉදිරිපත් කිරීම සඳහා වන අවසාන දිනය:

මුද්‍රා තැබූ ලංසු, **පිටපත් දෙකක්** සහ සියලුම අවශ්‍ය කරන ලියකියවිලි සමඟ,:

- ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම, හෝ
- අංක 437, ගාලු පාර, කොළඹ 03 ලිපිනයෙහි කාර්ය සම්පාදන අංශයෙහි ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලීම.

.

**2026** මාර්තු **17** වන දින ප.ව. **01.00** ට හෝ ඊට පෙර සිදු කළ යුතුය. **ප්‍රමාද වී ලැබෙන ලංසු පිළිගනු නොලැබේ.**

ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති අවසාන වේලාව ඉකුත් වූ වහාම, පහත සඳහන් ලිපිනයට පැමිණීමට බලාපොරොත්තු වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "බලශක්ති අමාත්‍යාංශය සඳහා වාහන නැවැත්වීමේ පහසුකම් සහිත කාර්යාල පරිශ්‍රයක් බදු කුලි පදනම මත ලබා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කරන්න.

**විමසීම්:**

**කාර්ය සම්පාදන අංශය,**
බලශක්ති අමත්‍යාංශය:
දු.ක.: 011-2574740/011-2574922 (දිගුව 205,206)
කාර්යාල වේලාවන්: පෙ.ව.9:00 – ප.ව.4:00

**සභාපති**
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව/ වෙනුවට
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (කාර්ය සම්පාදන)
බලශක්ති අමාත්‍යාංශය
අංක 437, ගාලු පාර, කොළඹ 03
දිනය 2026.02.18